For private circulation only

# THE WAND

ORGAN OF THE SRI LANKA MAGIC CIRCLE

www.srilankamagic.org

July 2016

The Official Guardian of Magic



**Star Performer**
**Lalith Wickramasinghe**
**Magician of the Year -2005**
**Three times winner of the Runner-up shield in 'Open National Championship'**

## In this issue


June Get-together P.2
Board decisions P.3
Member NEWS P.3
History of Magic P.4
July Birthdays P.7
International NEWS P.8


**GET-TOGETHER**
**Sunday 31st July 2016**
**at 9.30 a.m.**


EDITOR:
HDN Gunasekara | Tel: 0812421255 | Mobile: 0716420676
E-Mail: hdngunasekara@gmail.com

No. 33/3/A, Galmaduwa Watta Road,
Kundasale 20168,

## June Get-together - 26.06.2016

June monthly get together was held at the "Vishmithapaya" on 26/06/2016 commencing around 10.00 am. Following Members were present. **Amarasiri Wijesinghe, Ajith Fernando, Alex Perera, Asanka K. Pathirana, Banuka Harshajith, Chandrasena Gamage, Chenul Perera, D. D. C. Heendeniya, Dinesh Thangavel, Gayan Gurusinghe, Joy De Silva, K. W. Silva, Keerthi Weerawardena, Lalith Wickremasinghe, Priyantha Gamage, Ranjith Dharmapala, Rohan Jayasekara, Sambuddika Rathnayake, Sanjeewa Hewapathirane, Suranjith De Soysa, ,Terry Amerasekera and Yogitha Anthony.** The notice of absences were received from **Chrisantha Silva, Devsiri Fernando, H. D. N. Gunasekera, Shelton Jayasekera, Thusitha Jayasekera, Wilhelm Perera and Ronald De Alwis .**

The President Rohan welcomed the members and thanked for their participation. He emphasized the importance of participating at the monthly get-together where members can share their knowledge and have the opportunity to learn new techniques.

Amarasiri Wijesinghe started the performance by members for the day by presenting the trick that was taught by Sanjeewa at the last get together. This was followed by a cut and restore rope trick by Yogitha Anthony. Thereafter President Rohan explained how to present the same trick in different ways. He also performed a card magic. The next performer was Alex Perera. Lalith Wickramasinghe entertained the audience by performing a Glass Card trick.



Next the Star Performer Sambuddhika Rathnayake came in. It was a complete magic show with lots of various tricks that consisted, dove magic, milk magic, flower productions, silk and rope magic. He further did several sleights of hand and body loadings.

Sanjeewa Hewapathirana showed and explained a rope magic which was the trick of the day lesson for the members. The members highly appreciated it. This was followed by a rope trick by Bhanuka Silva and a magical classic 'Billiard Balls' by Chenul Perera

The treat for the day was sponsored by Chenul Perera.
The proceedings of another interesting day came to an end around 12.30 pm.
***_Recorded by Suranjith De Soysa.***

***(It is nice to see the faces of senior members and former office bearers, Alex, Clarence, Joy & Terry together with Chandra in front row, as enthusiastic as the youngsters ……. Editor)***











## SLMC BOARD DECISIONS විධායක සභා තීරණ

තරඟ කරුවන් කිසිවකුත් ඉදිරිපත් වි නොමැති බැවින් ජූලි 31 දිනට යොදාගෙන තිබු
**"2016 - ළමා මැජික් ශිල්පියා" සහ "2016 - ආධුනික මැජික් ශිල්පියා"**
<u>තරඟ නො පැවැත්වීමට තීරණය කර ඇත.</u>

**'Young Magician - 2016' & 'Amateur Magician -2016'** contests <u>will not be held</u> on 31st July as scheduled.

**<u>"2016 - වසරේ මැජික් ශූරයා"</u> තරඟය ළඟදීම පැවැත් වේ.**

**තරඟ කරුවන් සිටී නම් පමණක් තරඟය පැවැත්වෙනු ඇත. තරඟ සඳහා ඉදිරිපත් වීමට බලාපොරොත්තුවන සාමාජිකයන් ජූලි 31 දින හෝ එදිනට පෙර උප සභාපති සුරන්ජිත් ද සොයිසා (0777 208 660) වෙත තම නම, ලිපිනය සහ දුරකථන අංකය. බාරදෙන්න.**

**<u>'Magician of the Year- 2016'</u> Contest will be held soon.**

**Aspiring contestants please contact Suranjith De Soyza, VP Contests on or before 31 July. (0777 208 660)**

# SLMC MEMBER NEWS

## ♣ SALE OF MAGIC ITEMS – 31st July 2016

There will be a sale of Magic items by Sanjeewa Hewapathirana at the July Get-together. Come prepared to buy tricks & props to enhance your magic repertoire. සුදානම්ව එන්න අළුත් මැජික් අංගයන් මිලදී ගන්න, ජූලි සුහද හමුවේදී නවතම මැජික් අංග ප්‍රදර්ශනය කිරිමට සහ සාධාරණ මිලකට ඔබ වෙත ලබාදීමට සංජිව සුදානමින් සිටි.

## ♣ GRAND AUCTION SALE OF MAGIC ITEMS IN AUGUST

The SLMC Board hopes to organize an Auction-Sale of magic items at the August Get-together. Those who wish to auction the props that are in working condition, please contact Sambuddhika (0776159198) and give the details of the items. Publicity will be given in August 'Wand'

අගෝස්තු මස සුහද හමුවේදී මැජික් භාණ්ඩ වෙන්දේසියක් පැවැත්වීමට අදහස් කෙරේ. ඔබ දැනට භාවිත නොකරන එහෙත් සහෝදර ශිල්පියෙකුට ප්‍රයෝජනයට ගත හැකි මැජික් උපකරණ මේ සඳහා ඉදිරිපත් කළ හැක. සම්බුද්ධික (0776159198) අමතා ඔබ දිරිපත් කිරීමට බලාපොරොත්තු වන අංග පිළිබඳව දැනුම් දෙන්න. මීළඟ 'වොන්ඩ්' කලාපයෙන් එම භාණ්ඩ පිළිබඳව ප්‍රචාරයක් ලබා දෙනු ඇත.

## ♣ අභාවයයන්.

උප සභාපති ෂෙල්ටන් ජයසේකර මහතාගේ නැන්දනිය වූද , විශාර ජයසේකර මහතාගේ මිත්තණිය වූද, තුසිතා ජයසේකර මහත්මියගේ ආදරණිය මෑණියන් ගේ අභාවය සහ
ඒ.එන්.කුමාරගේ මහතාගේ ආදරණිය පියාණන් ගේ අභාවය පිලිබඳව පසුගිය කාලයේදී අපට වාර්තා විය.

එම අභාවයයන් පිළිබඳව ශ්‍රී ලංකා මැජික් කවයේ ශෝකය මෙසේ සටහන් කරමු.

## ♣ BIRTH ANNIVERSARY

119th Birth anniversary of Mr. Linden De Alwis (Prof. D'Alvo) falls on 27th July. He was a founder member of the 'Association of Ceylon Magicians' and the Senior Vice President of the SLMC at the time of his demise in January 1978. Linden was the father of the President Emeritus Lt. Col. Ronald De Alwis.

# HISTORY OF MAGIC - I

# මැජික් කලාවේ ඉතිහාසය

**මැජික් පිළිබඳව ඇත අතීතයේ පටන් සටහන්ව ඇති තොරතුරු ගොනුකිරීමට දරන උත්සාහයකි මේ.....**




**මැජික් පිලිබඳ ඉතිහාසය සිංහල භාෂාවෙන් ලියැවී ඇති පොතක් තිබේදැයි වරක් අසංග දූරකතන ඇමතුමක් අතරදී මා විමසීය. වරින් වර විවිධ පොත් පත් වල ලිපි ලේඛන වල විවිධ ආකාරයෙන් කියවා ඇති නමුත් මැජික් පිලිබඳ ඉතිහාසය සඳහන් පොතක් ගැන මගේ මතකයට නො ආවේය. මැජික් ඉතිහාසය පිළිබඳව මා කියවා ඇති කරුණු අසා ඇති කරුණු ඇතුලත්කොට මට හැකි ආකාරයට කෙටි ලිපියක් සකස් කිරීමට උත්සාහයක් ගත යුතුය යයි අදහසක් ඇතිවුයේ එදිනය. එය කෙතරම් අපහසු කරුණක් දැයි පසක් වුයේ අන්තර්ජාලය ඔස්සේ අදාල තොරතුරු සොයා යන විටදීය. අනේක ප්‍රමාණයක් වන තොරතුරු, සිද්ධීන්, පුද්ගලයන් සහ ප්‍රවණතා අතුරින් මෙවන් කෙටි ලිපියකට ඇතුලත් කළ යුතු කොටස තොරා බේරා ගැනීමයි මතුවූ ප්‍රධානම ගැටළුව. වාර්තාගත කරුණු අතරින් බොහොමයක් බටහිර මැජික් ඉතිහාසයට අදාල කරුණු වන අතර යුරෝපියයන් ගුරු කොටගත් ඔවුනට වඩා පැරණි ඉතිහාසයක් ඇති පෙරදිග ඉන්දියානු සහ චීන මායා පිලිබඳ ජනකතා මිස පැහැදිලි වාර්තා නොමැති වීම කණගාටුවට කරුණකි. නිවැරදි දින වකවානු සහ කාල පරිච්ජෙද සැමවිටම පැහැදිලිව සඳහන් නොවන බැවින්, පහත සිද්ධි දාමයන් පෙළගැස්වීම අනුක්‍රමික නොවන බව ද සලකන්න.**

***සාමාන්‍යයෙන් සිදු නොවන යමක් සිදුකර පෙන්වීම. එ මගින් අන් අය පුදුමයට, බියට, සතුටට හෝ විනෝදයට පත් කිරීම මානව ඉතිහාසයේ ආරම්භයත් සමගම ඇති වූ ක්‍රියාවලියක් විය යුතුය. (අප අද 'මැජික්' මගින් කිරීමට උත්සාහ කරනුයේද එයම නොවේ ද?) ලොව පිළිගත් ආගම් දර්ශන පහල වීමටත් පෙර නොපෙනෙන බලවේග පිළිබඳව යම් යම් අදහස් දැක්වූ පුද්ගලයන්, අන් අය වෙත නොමැති සුවිශේෂී හැකියාවල් තමන් වෙත ඇති බව පෙන්විම සඳහා විවිධ ක්‍රියා උපයෝගී කර ගන්නට ඇත.***

**Rudyard Kipling ගේ 'On the City Wall' කතාවෙහි හි ලොව පැරණිම වෘත්තීය පිලිබඳ වූ සටහනින් පසුව ලොව දෙවැනි පැරණිම වෘත්තීය තම වෘත්තීය ලෙසට කරුණු ඉදිරිපත් කළ වෘත්තික කණ්ඩායම් අතර මැජික් ශිල්පීන් ද වේ. ඒ මැජික් ශිල්පයට මානව වර්ගයා තරමටම දිගු ඉතිහාසයක් ඇති බැවිණි.**

**අන්තර් ජාලය තුල "History of Magic" සොයා යාමේදී අපට බහුලව හමුවන්නේ 'Black Magic', 'Spiritualism' නැතහොත් 'Occult Arts' වැනි ගුප්ත විද්‍යාවන් පිළිබඳව තොරතුරුය. අතීතයේදී විවිධ දෙවි දේවතාවුන් වෙනුවෙන් ඉදිවූ දේවාලවල පූජක වරුන් විසින් තම අනුගාමිකයන් ගේ භක්තිය වැඩි කිරීමටත්, දෙවියන් පිළිබඳව බියක් ගෞරවයක් ඇති කිරීමටත්, අනුගාමිකයන් තමන් වෙත බඳවා තබා ගැනීමටත් විවිධ භෞතික උපක්‍රම යොදා හාස්කම් දැක්වූ අවස්ථා බොහොමයක් ගැන පුරාවිද්‍යා සොයාගැනීම් වල සඳහන්ව ඇත. දේව අල්තාරය මත ගිනි පූජා කළ විට ඉබේ විවෘත වන ද්වාර, දෙවියන් ඉදිරියේ කන්නලව් කළ විට දේව ප්‍රතිමාවේ මුඛය තුලින්ම ආශීර්වාද කරනා හාස්කම්ද පිළිබඳව ග්‍රීක මිසර ආදී පැරණි ඇදහිලි තුල දැක්වේ. Ventriloquism නොහොත් මායාකථනය ක්‍රි.පූ. 6 වන සියවසේදී පමණ ග්‍රීක දේවස්ථාන වල දී යොදාගෙන ඇති බව සැලකේ.**





**ලොව ප්‍රධාන ආගම් සියල්ලේම පාහේ ආගමික සාහිත්‍යයේ විවිධ ආකාරයේ ආශ්චර්යයන් සඳහන් කර ඇත. අහසින් ගමන් කිරීම, ජලය මත ඇවිදීම, සිරුරින් ජලය සහ ගින්දර පිට කිරීම, ජලය වයින් බවට හැරවීම, එකවර දෙතැනක පෙනීසිටීම, අන් අයගේ සිත් කියවීම, මුහුද දෙබෑ කිරීම, සඳ දෙපලු කිරීම වැනි දේ ආගමික ඉතිහාසයන් සහ සාහිත්‍යයන් තුල සඳහන්ව ඇත. (මෑත යුගයේ මැජික් ශිල්පීන් කළේ ප්‍රාතිහාර්යයන් ලෙස සලකන මෙවන් දේ භෞතික ක්‍රම හෝ ඇස්බැන්දුම් මගින් කර පෙන්වීමට උත්සාහ ගැනීමයි. ජනතාව එවැනි දේ තම දැසින්ම දැකීමෙන් විශ්මයට මෙන්ම සතුටට පත්වන බව ද සැබෑවකි.)**

**උදාහරණයක් ලෙස අපේ 'මහා වංශය' ලිඛිත ඉතිහාසය තුල ඇති එක් සඳහනක් දක්වමි. මිහිඳු හිමියන් දෙවනපෑතිස් රජු වෙත 'මහා මෙව්නා' උයන තුල විවිධ ස්ථාන දක්වද්දී රජතුමා පූජා කළ ඉදිනු අඹ ගෙඩියක් වළඳා අඹ ඇටය සිටවා දිය වක්කරන්නට උපදෙස් දුන් බවත් එකෙනෙහිම ප්‍රාතිහාර්යයක් සිදුවී එම අඹ ඇටය පැළවී අඹ ගසක් බවට පත්වූ බවත් දක්වා ඇත. ඒ ක්‍රි.පූ. 250 දී පමණය. (ඉන් වසර 2000 කට පමණ පසු 19 වන සියවසේදී ඉන්දියානු වීදි මැජික් ශිල්පීන් දැක්වූ 'Mango Tree Trick' යනු මේ**

හැර අන් කවරක්ද? මැජික් ශිල්පීන් කරනුයේ ඉතිහාසයේ සඳහන් ප්‍රාතිහාර්යයන් තාක්ෂණික ක්‍රම මගින් හෝ ඇස්බැන්දුම් මගින් කර පෙන්වීම නොවේ ද?)

ක්‍රි.ව. 40 පමණ විසූ සයිමන් මාගස් (Simon Magus aka Simon the Sorcerer) මායා කරුවකු බවද, ඔහු විවිධ හාස්කම් මගින් ජනතාව අතර පිළිගැනීමකට ලක්ව සිටි බවද, අහසේ පාවීමේ (Levitation) හාස්කම පෙන්වද්දී පොළොවට ඇද වැටී මියගිය බවද සඳහන් වේ. බයිබල් කතාවලට අනුව මෝසෙස් සහ ඒරන් (Moses & Aaron) පාරාවෝ රජ අභියස දේව අනුහසින් යෂ්ටියක් සර්පයෙකු බවට පත්කිරීම වැනි ප්‍රාතිහාර්ය දක්වද්දී ඒ සමාන ප්‍රාතිහාර්ය මායා බලයෙන් කළ හැකි මායා ශිල්පීන් මිසරයේ වාසය කර ඇත. (පාසල් සිසුවෙකු ලෙස 1960 ගනන් වලදී නැරඹූ Cecil B. Demille ගේ Ten Commandments සිනමා පටයේ මෙම දර්ශනය මේ ලියන අවස්ථාවේදී ද මා මතකයට එයි.)


WESTCAR PAPIRUS & BENI HASSAN Murals interpreted as Cups and Balls

ප්‍රසාංගික මැජික් දර්ශනයක් ගැන ලිඛිත සාක්ෂියකින් දැක්වෙන පළමු අවස්ථාව වන්නේ ක්‍රි.පූ. 1700 දී පමණ මිසරයේ විසූ ‘ඩෙඩී’ (Dedi) නම් මැජික් ශිල්පියා පිළිබඳව ඇති සටහනයි. ඔහු පාරාවෝ රජ පෙළපතෙහි ‘කුෆු’ (Pharaoh Khufu) නම් රජුගේ රාජ්‍ය සභාවෙහි දී පාත්තයකුගේ හිස කඩින් කපා වෙන්කොට නැවත සවි කර පෙන්වූ බව සඳහන්ය. මිනිසෙකුගේ හිස කපා වෙන්කොට නැවත සවි කර පෙන්වන ලෙසට රජු කළ නියෝගය ‘ඩෙඩී’ විසින් ප්‍රතික්ෂේප කරන ලද බවද එහි දක්වා ඇත. දැනට ජර්මනියේ බර්ලින් නුවර ජාතික කෞතුකාගාරයෙහි ඊජිප්තු අංශයේ සුරක්ෂිතව ඇති පැපිරස් ලියවිල්ලක මේ බව සඳහන්ය. වෙස්ට්කාර් පැපිරස් (Westcar Papyrus) නමින් ප්‍රකට, (පුස්කොළ පොතකට සමාන) ඉතා පැරණි මෙම පැපිරස් පත හෙන්රි වෙස්ට්කාර් (Henry Westcar) නම් අයෙකු විසින් 1824 දී පමණ ඊජිප්තුවෙන් රැගෙන ආ එකක් බව කියැවේ.


Cups & Balls and the Pick-pockets

Beni Hassan පිරමීඩය තුල දක්නට ලැබුණු සිතුවමක් ප්‍රකට ‘කප්ස් ඇන්ඩ් බෝල්ස්’ (Cups & Balls) මැජික් අංගයට හුරුකමක් දක්වන බව සමහර පුරාවිද්‍යාඥයෝ පවසති. මුල් ශතවර්ෂ වලදී රෝමයේ Asatabula et calculi නමින් වයින් කෝප්ප සහ ගල් කැට යොදාගෙන Cups & Balls ක්‍රීඩාව ඉදිරිපත් කර ඇති බවද දැක්වේ. ඈත අතීතයේ පටන් පවතින ඉපැරණි මැජික් අංගයක් ලෙසට බොහෝ චිත්‍ර සහ කැටයම් වල පැහැදිලිව දක්නට ඇත්තේ මෙම Cups & Balls අංගයයි. වංචා කාරයින් සහ කපටි පුද්ගලයින් මිනිසුන් රැවටීම සඳහා අතේ හුරුව (Sleight of Hand) යොදා ගත් බවද සඳහන්ය. Cups & Balls ක්‍රීඩාව දැක්වෙන බොහෝ පැරණි චිත්‍ර වල දක්නට ඇති එක් විශේෂිත කරුණක් වන්නේ නරඹන්නන් අතර සිටින ගැට කපන්නෙකු උනන්දුවෙන් නරඹන අයෙකුගේ මුදල් පසුම්බිය පැහැර ගන්න ආකාරය සිතුවම් කර තිබීමය. බොහෝ විට මැජික් ශිල්පියාගේම සහායකයකු මෙම කටයුත්ත සඳහා යොදාගත් බව ද මේ මගින් ගම්‍ය වේ.

ඉන්පසුව ශතවර්ෂ ගණනාවක් තිස්සේ මැජික් පිළිබඳව පැහැදිලි සඳහනක් දක්නට නොලැබේ. නමුත් මෙම කාලයේ දී යන්ත්‍ර-මන්ත්‍ර, හදී-හූනියම්, කොඩිවින වැනි ගුප්ත විද්‍යා කටයුතු සඳහා මැජික් මූලධර්ම භාවිත කර ඇත. 8 වෙනි හෙන්රි රජු සමයේදී එංගලන්තයේ මන්ත්‍රකාරියන් (Witches) පිළිබඳව ලොකු විරෝධතාවක් ඇතිවූ අතර භූතාත්ම මගින් හෝ යක්ෂාරූඩයෙන් කෙරෙන යන්ත්‍ර-මන්ත්‍ර, හදී-හූනියම් තහනම් කරන ලදී. ඒවායේ නිරත වූ අය අල්ලා අධිකරණය මගින් මරණ දඬුවමට පවා පත් කරන ලදී. පල්ලියේද පෙළඹවීම මත කෙරුණු මෙම සංහාරයේදී යන්ත්‍ර-මන්ත්‍ර ගුරුකම්වල යෙදුණු සහ යෙදුණු බවට චෝදනා ලත් දස දහස් ගණනක් මන්ත්‍රකාරියන් වධ හිංසනයන්ට පත් කොට මරණයට පත් කර ඇත.


Witch Hunt and 'The Discovery of Witchcraft'


1584 දී රෙජිනෝල්ඩ් ස්කොට් (Reginold Scot) නම් ප්‍රභූ මහජන නියෝජිතයකු විසින් සානුකම්පිකව ලියන ලද ‘The Discoveries of Witchcraft’ නම් පොත මැජික් ශිල්පයට අයත් යම් යම් රහස් සහ ක්‍රමයන් හෙළිකරමින් ලියැවුණු ප්‍රථම කෘතිය ලෙස සැලකේ. ස්කොට් මන්ත්‍රකරුවන් මන්ත්‍රකාරියන් තුල භූත බලවේග ඇති බවට චෝදනා නගා මරණ දඬුවම දීම අසාධාරණ බවට මතයක් ඉදිරිපත් කළ, ඒ වෙනුවෙන් පෙනී සිටි අයෙකි. ඔවුන්ගේ එම හාස්කම් සහ අද්භූත ක්‍රියා කරනුයේ සුවිශේෂී බලයකින් නොව, වෙනත් සැඟවුණු සරළ භෞතික උපක්‍රම මගින් බවත් සනාථ කිරීම පිණිස මෙම හෙළිදරව් කර ඇත. මෙහිදී කඩින් වෙන් කළ හිස සහ තවත් Sleight of Hand ක්‍රමවේදයන් හි රහස් හෙළි කර තිබේ. John Cautares නම් මැජික්

ශිල්පියෙකු වෙතින් මැජික් රහස් පිළිබඳව ස්කොට් උපදෙස් ලබා ඇති බවද දැක්වේ. මෙම කාලයේදීම එනම් 1584 දී ප්‍රංශ බසින් ලියැවුණු මැජික් පිලිබඳ ප්‍රථම පොතද පළවී ඇත. ඒ Jean Prevost ගේ 'La Premiere Partie Des Subtiles et Plaisantes Inventions' යන්නයි. පහසුවෙන් කළ හැකි මැජික් අංග මෙහි ඇතුලත්ව තිබී ඇත.

(මීට පරිබාහිරව මධ්‍යකාලීන යුගයේදී උගත් බුද්ධිමත් පිරිසක්ද ගුප්ත විද්‍යාව සහ භූතාත්මයන් සමග සම්බන්දතා ගොඩනගා ගැනීම පිළිබඳව හදාරමින් පර්යේෂණ පවත්වමින් අධ්‍යන කටයුතු වල නිරත වූ අතර ඔවුන්ගේ පර්යේෂණ වාර්තා ග්‍රන්ථ ලෙස එළි දක්වා ඇත. ඔවුන් අතර Johann Faustus, Roger Bacon, Cornalius Agrippa, John Dee, Edward Kelly යන ප්‍රමුඛ නම් සඳහන් වේ. තවද 18 වන ශතවර්ෂයේදී යුරෝපයේ ඉහළ උගත් සමාජයේ ක්‍රියාත්මක වූ අසාමාන්‍ය හැකියාවන් සහ බලයක් තිබූ පුද්ගලයන් ලෙස Saint Germain, Count Allendro de Cagliostro, Dr. Franz Mesmer යන අය පිළිබඳව ද සඳහන්ය. ආගමික පසුබිම තුල ගුප්ත විද්‍යා ක්‍රමවේද සහ භූත බලවේග අතීතය පිළිබඳව 19 වන සියවසේ මැද භාගයේදී Eliphas Levi නම් අයෙකු ප්‍රංශ බසින් ලියන ලද 'Dogme et Rituel de la Haute Magie' නම් පොතක් 'History of Magic' නමින් 19 වන සියවස මුලදී A.E.White විසින් ඉංගිරිසියට පෙරළා ඇත. )




16 -17 වන සියවස් වලදී දක්නට ලැබුණ තවත් ප්‍රවණතාවයකි සතුන් යොදාගෙන විස්කම් ඉදිරිපත් කිරීම. විලියම් බැන්ක්ස් (William Bankes) නම් අයෙකු මැරෝකෝ (Marocco) නම් පුහුණුකළ බුද්ධිමත් අශ්වයකු සමග විවිධ දර්ශන ඉදිරිපත් කළ බව වාර්තා වේ. පා දෙකකින් ඇවිදීම ගණිත, ගැටළු විසඳීම, අකුරු සහිත කාර්ඩ් පත් තෝරා වචන සෑදීම වැනි අපහසු ක්‍රියාකාරකම් වල සතුන් යෙදවීම මිනිසුන් දකින්නට ආසා කරන ආශ්චර්යයන්ය. මේ ආකාරයට පුහුණුකළ ටෝබි (Toby the'Learned Pig') නම් ඌරෙකු ගැන සහ මියුටිනෝ (Mutino) නම් බල්ලකු ගැනද දැක්වේ. පුහුණුකළ බුද්ධිමත් සතුන් සමග තැනින් තැන යමින් සල්පිල් වෙළඳපොල ආදියෙහි දර්ශන පවත්වමින් මුදල් ඉපයූ පුද්ගලයින් පිළිබඳව බොහෝ සටහන් දක්නට ඇත. (ආසියානු කලාපයේ ඇත අතීතයේ පටන් දක්නට ලැබෙන නයි නැටවීම වැනි ශිල්ප ක්‍රම බටහිර රටවල වුවාදැයි පැහැදිලි සඳහනක් දක්නට නොලැබුණි.)



ගිනි සිසිල නොහොත් ගින්දර සමග සෙල්ලම් කරන ක්‍රීඩාවද අතීතයේ පටන්ම විශ්මය, ත්‍රාශය සහ විනෝදය සැපයූ ප්‍රාසංගික ශිල්පයකි. ගින්දර කන 'Fire Eaters' නම් ශිල්පින් ද තැනින් තැන යමින් සල්පිල් වෙළඳපොල ආදියෙහි දී දර්ශන පවත්වන ලද බවද සඳහන්ය. ගල්, බොරළු, වීදුරු කටු, යකඩ ඇන වැනි දෑ ගිල පෙන්වීම ('Stone Eaters') ද අතීතයේ සිට පැවතුන ත්‍රාශජනක වීදි-ප්‍රාසංගික ශිල්පයකි. තවත් විශේෂ කණ්ඩායමක් වූයේ වතුර ලොකු ප්‍රමාණයක් පානය කර විවිධ ආකාරයට විවිධ වර්ණ සහිතව කටින් වතුර පිටකළ (Water Spouters') ශිල්පීන්ය. Jugglary නමින් අප අද අප හඳුන්වන දැඩි පුහුණුවක් සහිතව කළහැකි හපන්කම් සහ ලණු මත සමබරව ඇවිදීම (Rope Walkers) වැනි සර්කස් ගනයට වැටෙන හපන්කම් ඉදිරිපත් කළ ශිල්පිහුද අතීතයේ පටන් ජනතාව එක් රොක් වන තැන්වල තම දර්ශන ඉදිරිපත් කරමින් මුදල් උපයන ලදී.

මේ සමගම 18 වන සියවස මුල් කාලයේදී එංගලන්තයේ ජනයා එක් රැස් වන සල්පිල් වෙළඳපොල ආදියෙහි දී ඇස්බැන්දුම් (මැජික්) දර්ශන ඉදිරිපත් කරමින් සැරි-සැරූ ශිල්පීන් ගැන ද වාර්තා බොහොමයක් පවතී. ඒ අපේ විෂය පථයට අදාල මැජික් කලාවේ පුරෝගාමීන්ය. ඔවුන් පිළිබඳව අපි ඉදිරි දිනකදී කතාකරමු.

(ඉදිරිපත් කිරීමේ පහසුව තකා සමහර තැන්හි ඉංග්‍රීසි වචනය පමණක් යොදා ඇති බව සලකන්න. මෙවැනි ලිපි ඔබට ප්‍රයෝජනවත්ද? මෙම ලිපි පෙළ ඉදිරියට ගෙනයාමට කියවන ඔබේ ප්‍රතිචාර ඉතා වැදගත් බව කාරුණිකව සලකන්න. ලංකාවේ මැජික් පිළිබඳව උනන්දුවක් දක්වන සීමිත කණ්ඩායම වන මැජික් කවයේ සාමාජිකයන්ට මේ තොරතුරු නොවැදගත් නම් මේ සඳහා කාලය යෙදවීම වෙහෙස වීම තේරුමක් නැති ක්‍රියාවකි. ඉහත ලිපියේ ම වෙතින් ගිලිහී ඇති තොරතුරු මතක් කර දෙන්න. ඇතුලත් කරුණු පිළිබඳව ඔබ එකඟ නොවන තැන් දන්වන්න. ඉහත කරුණු වලට අමතරව ඔබ දන්නා දේ අන් අයගේ දැනුම පිණිස පළකිරීමට ලියා දන්වන්න.)

*අන්තර්ජාලයේ ඇති කරුණු උපුටා ගැනීම සහ ප්‍රකාශයට පත් කිරීමේ නීතිමය තත්වය ගැන පැහැදිලි අවබෝධයක් මා වෙත නොමැත. 'The Wand' මාසිකය, මැජික් කවයේ සාමාජිකත්වය අතර පමණක් බෙදහැරෙන ප්‍රකාශනයකි. එබැවින් උපුටාගත් තොරතුරු ඉදිරිපත් කිරීම ගැටළුවක් නොවේයැයි සිතමි. අන්තර්ජාලයට අමතරව Professor Edwin A. Dawes ගේ 'The Great Illusionists' නැමති ග්‍රන්ථයද, Geoffrey Lamb විසින් සම්පාදිත 'MAGIC, Illustrated Dictionary' ශබ්දකොෂයද, Daniel Cohen ගේ 'Magicians, Wizards, & Sorcerers', සහ Milbourne Chistroper ගේ 'MAGIC, A Picture History' යන පොත්ද බෙහෙවින් උපකාරී වූ බව කෘතඥතා පූර්වකව සඳහන් කරමි.*

***'If You Steal From One Author, It's Plagiarism; If You Steal From Many, It's Research"***

## Who am I?

I am as old as the race,
Yet I am discovered a new every day.
I bring joy to children of all ages,
I young and old thrilled to my fascination.

I am seeming challenger to nature's laws,
Yet I depend on them.
I am an apparent contradiction of what man knows to be true,
Yet I am true as all fantasy.

Science, religion and Medicine were once my companions,
Today scientists, priests and physicians
are numbers among my devotees.
I know no nationality, no creed,
For my followers are found among all races.

The child believes in me,
The man wishes me might,
And the aged find me in their memories.

In me the schoolboy finds a thrilling hobby,
the harassed businessman finds relaxation,
the doctor finds a new therapeutic,
and the lawyer finds a law unlike his laws.

Through me some finds the wealth and fame,
And all find good fellowship

I am 'Magic'

Rev. Willard S. Smith (1898-1981)

## මා කවුද?

මිනිස් වග පමණටම වයස් ගත වෙමි,
එ නමුදු දිනෙන් දින යලි යලිත් උපදිමි.
ළමා කැළ වෙත සතුට ගෙන එමි,
තුරුණු, වැඩිහිටි, මහලු, සැම දෙනම පිනවමි.

සොබා දහමට මා එරෙහි බව පෙනුන ද,
සොබා දහම මය මා ගේ පදනම ද.
සත්‍යය ට එරෙහි දෝ දකින ඔබ සිතුවත්,
සත්‍යය ම පමණි මා නැත කිසි මුසාවක්.

ආගමද ,විද්‍යාව,වෙදකම, සමග විසුවෙමි මා පෙරදින,
පූජක, වෙද, විදු සැවොම අද වෙති මා සමග බැතියෙන.
ජාතිය මිනිස් වේ නොමැත අන් බෙදුමක්,
වර්ණ, කුල, ආගම් නැත බේද කිසිවක්.

මා සැබැවයි සිතන දරුවන් තුටුවෙති මා සමගින
වැඩිහිටි මනාපය මා සැබෑවක් වීම මය
වියපත් අය වෙත ගෙනෙමි මතකය ළමාකල
නැත වයස් පරතරය සැවොම මා හා ඇත තුටින

සිසුන් හට සෙල්ලමකි විනෝදය ගෙන දෙන
මනස වෙහෙසෙන අය ලබති සහනය මා වෙතින
වෙදැදුරු සොයා යයි වෙදකමක් මා තුලින
දකී අධිකරණය ද නොමැති නීතිය එතැන

පරසිදු බවත් ධනයත් ලබති සමහරු මා වෙතින
සුහද බැම්මෙන් බැඳෙති සැවොම මා සමග එක්වන


අන් කිසිවකු නොවේ මා මැජික්...! ඔබ පිනවන

අනුවර්තනය: HDN ගුණසේකර



"Ear of bat, tail of dog. Leg of horse, head of fro... Let's just phone for a pizza."




# July Birthdays :


1st Yogitha Anthony
21st Ranjith Silva

## The oldest professions of the world

The following anecdote was received by the Editor in 1990 from the Star Magician, Past President Noel Wickramasinghe and appeared in 'The Wand' August 1990. Noel quoted Al Goshman…

------ It seems that there was an out of work magician driving slowly across the Brooklyn Bridge in the dead of night. Half way across he saw a young lady standing on a pylon, poised to jump. The magi stopped his car and ran over to support, yelling "Don't jump. Don't jump." After some persuasion the beautiful young woman clambered down. "Why on earth you were trying to commit suicide?" the magician asked. The woman replied "Well….. I am a hooker. With all of the permissiveness and promiscuousness in society today, the guys are getting it for free …… I can't get any work. I'm starving." The magician mused for a moment and commented. "I'm starving too…. Isn't it strange …….. The world's two oldest professions are being ruined by amateurs.

## David Copperfield buys Las Vegas Mansion for record $ 17.55 Million !







David Copperfield, most commercially successful magician in the history has paid $ 17.55 Million to buy a luxury mansion in Las Vegas. By doing so he did another illusion, "Vanishing of the old price record". The sale which closed in last month represents the highest price ever paid for a Las Vegas home.



***Yes, Through Magic some finds wealth & fame***

**'The Wand' සඟරාවේ පළකිරීම සඳහා ඔබගේ ලිපි එවන්න. 'මැජික් ශිල්පියෙකුගේ අත්දැකීම්', 'මාසයේ මැජික් අංගය', 'මැජික් රසකතා', යටතේ යමක් හෝ ඔබගේ ගැටළු හෝ ඔබගේ අදහස් උදහස් email මගින් හෝ තැපැල් මඟින් සංස්කාරක වෙත එවන්න.**

**සංස්කාරකගේ අදහස් පමණක් නොව සාමාජික අදහස්ද 'The Wand' සඟරාවේ පලවිය යුතුය.**